එම්. ජේ. එස්. ප්‍රභාත් මධුසංඛ.
ආලංකුලම,කඩිගාව,නිකවැරටිය.
912922740 වී.
දු:අ: 0705666711
Email - sudarshanaprabath25@gmail.com
2024.12. 17 දින.

කළමණාකාර තුමා,
ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
නිකවැරටිය ශාඛාව.

මහත්මයාණනි,

<u>ස්ථාවර නියෝගයක් පිළිබද විමසීම් සිදුකිරීම</u>

යොමුව : 2024.01.22 දින මා විසින් ඔබ බැංකු ශාඛාව අමතන ලද ලිපිය.

ඉහත නම, ලිපිනය සහ ජාතික හැදුණුම්පත් අංකය සදහන් මා ඔබ බැංකු ශාඛාවෙහි 100407707967 අංක දරණ ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලබන අතර, එම බැංකු ගිණුම වෙත මාගේ මාසික වේතනය බැරවනු ලබයි. මා විසින් ඔබ බැංකු ශාඛාව වෙතින් 2016 වෂර්යේ ණය මුදලක් ලබාගත් අතර, එම ණය මුදල 2024 ජනවාරි මස ගෙවා අවසන් කරන ලදී. ඔබ බැංකුව වෙතින් ණය මුදල ලබාගැනීමේදී මා විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමෙහි රක්ෂණාවරණයක් ආරම්භ කල අතර, ණය මුදල අවසාන වුවත් එම රක්ෂණාවරණය කල්පිරෙන තුරු පවත්වාගෙන යාමට අදහස් කර ඒ සදහා වූ වාරික මුදල වන රු:2000.00 (රුපියල් දෙදහස) ක ප්‍රමාණය සෑම මසකට පහත අංක දරණ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමේ ඔප්පු අංකය වෙත බැරකරන ලෙස යොමුගත ලිපිය මගින් මා විසින් ඔබ බැංකු ශාඛාව වෙත දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමේ ඔප්පු අංකය - 955879

එහෙත් ඔබ බැංකු ශාඛාව වෙතින් 2024 අගෝස්තු මස දක්වා මාසිකව අදාල මුදල වන රු:2000.00 ක ප්‍රමාණය ඉහත සදහන් ඔප්පු අංකය වෙත රක්ෂණ වාරිකය වශයෙන් හරකල අතර, 2024 සැප්තැම්බර් මස සිට මේ දක්වා මාස 03 ක කාලසීමාවක් එම වාරික මුදල හර නොවී අදාල රක්ෂණ සංස්ථාව වෙත ගෙවා නොමැති බැව් පෙන්වා දෙමි.

මේ සබැදිව ඔබ බැංකු ශාඛාව වෙතින් මා විසින් 2024.12.09 දින සහ 10 දින දුරකථන ඇමතුම් මගින් විමසීම් සිදුකලද ඒ සදහා පිළිතුරු මා සමබන්ධ කර පසුව ලබාදීමට කටයුතු සිදුකරන බැව් ඔබ ශාඛාවේ නියෝජිතයින් විසින් දැනුවත් කලද මේ වන තෙක් ඒ සබැදිව මා වෙත දැනුම් දීමක් සිදුනොකල බැව් දන්වමි.

ඔබ බැංකු ශාඛාව වැනි රාජ්‍ය බැංකු ගණයට අදාල වගකිවයුතු බැංකු ශාඛාවක් අප වැනි ගණුදෙනුකරුවන් මෙවැනි අපහසුතාවයකට පත්කිරීම මගින් ඔබ කෙරෙහි තැබිය හැකි විශ්වාසය පළුදු විය හැකි බැව් පෙන්වා දෙන අතර, අදාල රක්ෂණ සංස්ථාව වෙත මුදල් බැරනොවීම හේතුවෙන් මේ වන විට මහත් අපහසුතාවයකට පත්ව ඇත්තේ අදාල මාස 03 ට ගෙවිය යුතු මුදල එකවර ගෙවීමට සිදුවන නිසාවෙනි.

කරුණු එසේ හෙයින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව - නිකවැරටිය ශාඛාවෙහි කළමණාකරු වශයෙන් සේවය කරනු ලබන ඔබ වැනි මහජනතාවගෙන් වැටුප් ලබන රාජ්‍ය සේවකයෙකු විසින් සිදුවන මෙවැනි අතපසුකිරීම් මගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරස් සමාගම සමග අප විසින් පවත්වාගෙන යනු ලබන විශ්වාසවන්ත භාවය පළුදුවන බවත් මාස 03 ක කාලසීමාවක් මා විසින් රක්ෂණ වාරිකය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් හිමිවන වරප්‍රසාද දීමනාවන්හි කප්පාදුවක්ද ඇති වන බැව් අදාල රක්ෂණ සංස්ථාව මගින් මා වෙත දැනුම් දෙන ලදී. එවැන්නක් සිදුවීම කෙරෙහි සෘජුවම වගකිව යුතු ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් මා හට අදාල සිදුවීම සදහා තුඩුදුන් හේතුන් සදහන් කරන ලද ලිපියක් රක්ෂණ සංස්ථාවට ඉදිරිපත් කිරීම සදහා ලබාදීමට කටයුතු කරන මෙන් මින් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

තවද, රක්ෂණ සංස්ථාවට අදාල වාරිකය නොගෙවීම මා විසින් සිදුනොකරනු ලබන දෙයක් බවත් මා විසින් එම වාරිකය හර කරන ලෙස ස්ථාවර නියෝගයක් මගින් දැනුම් දී තිබියදී ඔබ බැංකු ශාඛාව වෙතින් එම ප්‍රමාද දෝශය සිදුවී ඇති බවත් අදාල ලිපියෙහි සදහන් කිරීමට වගබලා ගන්නා ලෙසත් වැඩිදුරටත් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මෙයට,
විශ්වාසී,

(එම්.ජේ.එස්.පී. මධුසංඛ)

පිටපත් :
ප්‍රධාන කළමණාකරු තුමා, ජාතික ඉතිරි කිරීමේ බැංකු ප්‍රධාන ශාඛාව, ඉතිරිකිරීමේ නිවස, අංක 225, ගාලුපාර, කොළඹ 03.
ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛාව - කුරුණෑගල